**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**
**தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை**
**National Child Protection Authority**

නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
இல:330 தலவத்துகொட வீதி மாதிவெல ஸ்ரீஜயவர்தனபுர.
NO. 330, Thalawatugoda Rd, Madiwela, Sri Jayawardenepura.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2778911, 011-2778912, 011-2778913, 011-2778914
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2778915
වි. තැපැල / மின்அஞ்சல / E. Mail: ncpa@childprotection.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Web Site: www.childprotection.gov.lk


UNIVERSITY GRANTS COMMISSION
10.45
07 FEB 2023
35
CHAIRMAN

R. 4460

2023.02.01

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා
සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
නො7/20,වෝඩ් පෙදෙස,
කොළඹ 07.

Chairman's Att.

AS
Pvt M

මහත්මයාණෙනි,

## ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් 2023 වර්ෂයේ සිට සෑම වර්ෂයකදීම ක්‍රියාත්මක කිරීම සඳහා නව වැඩසටහනක් ලෙස ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන හඳුන්වාදී ඇත. අනාගතයේ විවිධ වෘත්තීන් නියෝජනය කිරීමට අවතීර්ණ වන විශ්වවිද්‍යාල ශිෂ්‍ය පරපුර අතර ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කරමින්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සමාජගත කිරීමේදී ළමා ආරක්ෂාව සහ අයිතිවාසිකම් පිළිබඳ දැනුමින් පරිපූර්ණ උපාධිධාරියෙක් නිර්මාණය කිරීම අරමුණු කර ගත් තිරසර වැඩසටහනක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ වෙමින් සිදුකිරීමට අපේක්ෂිතය. මෙම වැඩසටහන යටතේ විශ්වවිද්‍යාල වලින් පිටත්ව යන උපාධිධාරීන් වෙත ළමා අපයෝජන වලින් දරුවන් ආරක්ෂා කරගැනීමට අවශ්‍ය මූලික දැනුම ලබා දීම තුළින් ළමා අපයෝජන අවම කිරීමට සහ ළමා ආරක්ෂාව තහවුරු කිරීමට හැකියාව ලැබේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති සියලුම විශ්වවිද්‍යාල වල දෙවන වසර සහ තුන්වන වසර අභ්‍යන්තර සිසුන්ට පමණක් මෙම වැඩසටහනට ලියාපදිංචි විය හැකිය. එම සිසුන්ට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමග එක්ව ළමා ආරක්ෂාවේ තානාපතිවරුන් ලෙස සිය ස්වේච්ඡා දායකත්වය ලබාදීමට අවස්ථාව සලසා දී ඇත. වැඩසටහන අවසානයේ දී, සහභාගී වන සිසුන්ට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහතිකයක් නිකුත් කරනු ලැබේ.

එසේම, මෙම වැඩසටහන පිළිබඳ වැඩිදුර විස්තර මෙම ලිපිය සමග යොමු කරනු ලබන සංකල්ප පත්‍රිකාව (ඇමුණුම 01) සහ අයදුම්පතේ ආකෘති පත්‍රය (ඇමුණුම 02) මගින් ඔබවෙත ඉදිරිපත් කර ඇත. මෙම වැඩසටහන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග ඉදිරි කටයුතු සම්බන්ධීකරණය කිරීමට සුදුසු ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු සහ සෑම විශ්වවිද්‍යාලයකින්ම සම්බන්ධිකරණ නිලධාරියෙකු ලෙස මහාචාර්යවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු පත්කිරීම සඳහා විශ්වවිද්‍යාල සඳහා සුදුසු උපදෙස් ලබාදෙන මෙන් ඔබතුමන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ළමා ආරක්ෂාව තහවුරු වූ ශ්‍රී ලංකාවක් බිහිකිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමඟ අත්වැල් බැඳගනිමින් මෙම ජාතික වගකීමට උරදෙන ඔබතුමාට සහ ඔබ ආයතනයට අපගේ ගෞරවය පිරිනමමු. ඔබතුමා ලබාදෙන සහයෝගය සමගින් මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

මෙම වැඩසටහන පිළිබඳව වැඩි විස්තර දැනගැනිමට අවශ්‍යනම් ශානිකා මලල්ගොඩ, අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු - 071 - 7151506, 0112778911- දිගු අංකය (142) ඔස්සේ සම්බන්ධ කරගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන් ඔබතුමන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

උදයකුමාර අමරසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

MA3
pl. send to all VCs as instructed by Ch. sir. UGC nomination will be sent in due course.
10/02/23

# සංකල්ප පත්‍රිකාව

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා ගැනීමේ සංකල්ප පත්‍රිකාව

කාන්තා , ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ රාජ්‍ය අමාත්‍යාංශය

| | |
|---|---|
| 01. දෙපාර්තමේන්තුව/ අධිකාරිය | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| 02. අංශය | සැලසුම් හා තොරතුරු අංශය |
| 03.ඒකකය | තොරතුරු හා මාධ්‍ය ඒකකය |
| 04.ක්‍රියාකාරී සැලැස්ම | ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම - 2023 |
| 05.වැය ශීර්ෂ අංකය | NDAP 3.3 (3.3.2) |
| 06.වැය ශීර්ෂය සඳහා අනුමත කරන ලද මුදල් ප්‍රමාණය | රු.මි. 0.500 |
| 07. වැඩසටහනේ නම | විශ්වවිද්‍යාල සිසුන් සඳහා වන ළමා ආරක්ෂාව පිළිබඳ "විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" |
| 08. දෙපාර්තමේන්තුව/ අංශය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමේ හා සම්බන්ධීකරණ වගකීම දරණ නිලධාරියාගේ නම හා තනතුර | ශානිකා මලල්ගොඩ<br>අධ්‍යක්ෂ සැලසුම් හා තොරතුරු |

## 09. හැඳින්වීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන **"ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන "** විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම අරමුණුකර ගත් **විශේෂයෙන් නිර්මාණය කරන ලද** වැඩසටහනක් **වේ.** ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඕනෑම විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර උපාධි අපේක්ෂක දෙවන සහ තුන්වන වසර සිසුන්ට පමණක් මෙම ස්වේච්ඡා වැඩසටහන සඳහා ලියාපදිංචි විය හැක. මෙම වැඩසටහන **විශ්වවිද්‍යාල ශිෂ්‍ය පරපුර අතර ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කරමින්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සමාජගත කිරීමේදී ළමා ආරක්ෂාව පිළිබඳ දැනුමින් පරිපූර්ණ උපාධිධාරියෙක් නිර්මාණය කිරීම** අරමුණු කර ගත් තිරසර වැඩසටහනක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ වෙමින් සිදුකිරීමට අපේක්ෂිතය.

යොවුන් වයසේදී **විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපතිවරුන්** ලෙස ළමා ආරක්ෂාවට අදාලව ආකල්ප, කුසලතා හා ලබා ගන්නා දැනුම, අනාගත වැඩිහිටියන් ලෙස හෝ වෘත්තිකයන් වශයෙන් විවිධ ක්ෂේත්‍ර වල නියැලීමේදී ළමා ආරක්ෂාවට ප්‍රමුඛතාවය ලබාදීම, ළමා අපයෝජනයට එරෙහිවීම, ළමයින් ආරක්ෂා කිරීමට හැකි සෑම අවස්ථාවකම පියවර ගැනීම, නිර්මාණශීලීව ළමා ආරක්ෂාව තහවුරු වන නිර්මාණ සහ සංකල්ප ගොඩනැගීම ආදියට දායක විය හැකි ළමා ආරක්ෂක නියමුවෙක් නිර්මාණය කිරීම මෙහිලා ප්‍රමුඛ කරගැනේ. මෙහිදී ශ්‍රී ලංකාව තුළ ළමා ආරක්ෂාවේ තත්වය අවබෝධ කර ගැනීමට හැකියාව මේ තුළින් ගොඩනැගෙනු ඇත. එසේම අනාගතයේදී විදේශ විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් සමඟ

ළමා ආරක්ෂාවේ ගෝලීය අත්දැකීම් හුවමාරු කරගැනිමටද විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවකාශ ලැබෙනු ඇතැයි විශ්වාස කරනු ලැබේ.
විශේෂයෙන්ම, ළමා ආරක්ෂාවේදී යොවුන් උපාධි අපේක්ෂකයන් ළමා ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කරවීම වැදගත් වේ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් ලෙස එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිමේදී සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා වගවීම මේ තුළින් බලාපොරොත්තු වේ. තරුණ පරපුර ලෙස රටේ අනාගත ළමා පරපුර රැකගැනිමේ යුතුකම ඉටු කිරීමට මෙම වැඩසටහන තුළින් අවස්ථා උදාවේ.

## 10. <u>ප්‍රධාන අරමුණු</u>

1. ළමා ආරක්ෂාව පිළිබඳ වගකීමෙන් සහ වගවීමෙන් යුතු තරුණ ප්‍රජාවක් බිහිකිරීම.
2. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම.
3. ළමා හිතකාමී සහ ළමයින් සඳහා ආරක්ෂාකාරී පරිසරයක් ඇතිකිරීමට විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම.
4. ළමා අපයෝජන සිදුවීම් අවම කරගැනීම සහ වලක්වා ගැනීමට විශ්වවිද්‍යාල සිසුන්ගේගේ යෝජනා ලබා ගැනීම සහ ඒ සඳහා ඔවුන්ගේ සහභාගීත්වය සහ දායකත්වය ලබා ගැනීම.
5. විශ්වවිද්‍යාල සිසුන් ළමා ආරක්ෂාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගිකරවා ගැනීම.
6. විශ්වවිද්‍යාල සිසුන්ගේ අදහස් හා ලබා ගනිමින් ළමා ආරක්ෂාවේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ ආණ්ඩුවට උපදෙස් ලබා දීමට දායකකර ගැනීම.
7. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් සමග සම්බන්ධීකරණය සඳහා අවස්ථා ලබා දීම.

## 11. <u>මෙම ජාතික වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිඵල</u>

1. විශ්වවිද්‍යාල ප්‍රජාව අතර ළමා ආරක්ෂණය පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීම හා එය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන් දායක කරගැනීම.
2. ජාතික මට්ටමේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති සමුළු පැවැත්වීම හරහා විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම.
3. විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම.

## 12. <u>නෛතික ප්‍රතිපාදන</u>

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ **14 (ඇ,ජ,ඩ)** වගන්ති මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නෛතික ප්‍රතිපාදන හිමිවේ.

- <u>14 (ඇ) වගන්තිය</u>

  අපචාර වලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳව සහ ළමා අපචාර වැලැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.

- <u>14 (ජ) වගන්තිය</u>

ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරිම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබා දීම.

- 14 (ඩ) වගන්තිය

ළමා අපචාර පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීම.

13. වැඩසටහන ක්‍රියාත්මක කරන ක්‍රමවේදය

1. ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන සඳහා සහභාගිවීමට කැමති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඕනෑම විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර උපාධි අපේක්ෂක දෙවන සහ තුන්වන වසර සිසුන්ට පමණක් මෙම ස්වේච්ඡා වැඩසටහන සඳහා ලියාපදිංචි විය හැකිය. ලියාපදිංචිවීම සඳහා අයදුම්පත් www.childprotection.gov.lk යන වෙබ් අඩවියෙන් බාගතකර ගතහැකිය. එසේනැතිනම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී(DCPO), දිස්ත්‍රික් මනෝ සමාජයීය නිලධාරී (DPSO)හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්ගෙන් (DivCPO) ලියාපදිංචිවීමේ පෝරමය සහ තොරතුරු ලබාගත හැකිය.
2. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂිකව ලියාපදිංචිය ලබාගත යුතුය.
3. වැඩසටහන පිළිබඳව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමන්ගේ අත්සනින් යුතු ලිපියකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් මෙම වැඩසටහන පිළිබඳව දැනුවත් කරනු ලැබේ.
4. ඊට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් විශ්වවිද්‍යාල සමග වැඩිදුර සම්බන්ධීකරණය සිදුකරයි.

මෙම වැඩසටහන අදියර **05** කින් පැවැත්වේ.

අදියර **01** : "ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" සඳහා විශ්වවිද්‍යාල ලියාපදිංචිය ලබාගත් උපාධි අපේක්ෂකයන් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන.

අදියර **02** : ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන යටතේ ලියාපදිංචි වූ උපාධි අපේක්ෂකයන්ට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමග වසර 01 සිට 03 දක්වා කාලයක් ස්වේච්ඡාවෙන් කටයුතු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

එසේම පාසල් ශිෂ්‍ය තානාපති පාසලක් සමග කටයුතු කිරීමට අවස්ථාව ලබාදෙනු ඇත. ලියාපදිංචිය ලබා ගත් පාසල් ශිෂ්‍ය තානාපති සෑම පාසලක් සඳහාම, විශ්වවිද්‍යාල සිසුන් කණ්ඩායමක් මෙම වැඩසටහන යටතේ නම් කරනු ලැබේ. ඒ අනුව තනි සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කිරීමට විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත. මෙම වැඩකටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පූර්ණ අධීක්ෂණය,මගපෙන්වීම,තාක්ෂණික දැනුම,සම්බන්ධීකරණය සහ මෙහෙයවීම මත විශ්වවිද්‍යාල සිසුන් විසින් සිදුකළ යුතුය.

අදියර **03** : ළමා ආරක්ෂාව පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන

<u>03.1 - පළමු දිනය</u>

1. ළමා අයිතීන්, ළමා ආරක්ෂාව, ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සහ ළමා ආරක්ෂක අධිකාරිය යනු කුමක්ද, කාර්යයභාරය සහ වැඩසටහන් පිළිබඳ හඳුන්වාදීම.
2. ළමා ආරක්ෂාවේදී විශ්වවිද්‍යාල සිසුන් විසින් අනුගමනය කළ යුතු ආචාරධර්ම හඳුන්වාදීම.
3. ළමයින්ගේ සහභාගීත්වය ලබා ගැනීම, ළමයින් සමග සන්නිවේදනය කිරීම සහ ළමයින් සමග මහජන සම්බන්ධතා පැවැත්වීම.

<u>03.2 - දෙවන දිනය</u>

1. ළමයින්ට අදාල නීතිය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නීතිය බලාත්මතක කිරීම.
2. ළමයින්ට අදාල මනෝ සමාජයීය මැදිහත්කරණය.
3. අදහස් විමසීම සහ යෝජනා ලබා ගැනීම.

අදියර **04** : ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල මට්ටමින්, ශිෂ්‍ය සම්පත්දායක සංචිත සැකසීම සහ ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික මට්ටමින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය සම්පත්දායක සංචිතය සැකසීම.

අදියර **05**: විශ්වවිද්‍යාල ශිෂ්‍ය අත්දැකීම් හුවමාරුව සඳහා "විශ්වවිද්‍යාල ශිෂ්‍ය ජාතික සමුළුව" පැවැත්වීම

**14.** <u>වැඩසටහන් සැලැස්ම</u>

| වැඩසටහන් සැලැස්ම | එක් ක්‍රියාකාරකමකට ඇස්තමේන්තු මුදල (රු.මි) | ක්‍රියාකාරකම් සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තුව (රු.මි) | වැඩසටහන මෙහෙයවනු ලබන ආයතනය | ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත දිනය | අවසන් දිනය |
|---|---|---|---|---|---|---|
| 01<br>අදියර **01** -ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය | 0.200 | | 0.500 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මාධ්‍ය හා | 2023.01.01 | 2023.03.31 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තානාපති ජාතික වැඩසටහන" | | | | තොරතුරු ඒකකය | | |
| 2.<br>අදියර **02** - තනි සහ කණ්ඩායම් ලෙස විශ්වවිද්‍යාල සිසුන් සිදුකරන ස්වේච්ඡා ක්‍රියාකාරකම් | 0.000 | | 0.000 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මාධ්‍ය හා තොරතුරු ඒකකය | 2023.01.01 | 2023.03.31 |
| 3<br>අදියර **03** - විශ්වවිද්‍යාල සිසුන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන | 0.100 | | 0.500 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මාධ්‍ය හා තොරතුරු ඒකකය | 2023.04.01 | 2023.06.30 |
| 4.<br>අදියර **04** - ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල මට්ටමින්, ශිෂ්‍ය සම්පත්දායක සංචිත සැකසීම සහ ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික මට්ටමින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය සම්පත්දායක සංචිතය සැකසීම. | 0.000 | | 0.000 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මාධ්‍ය හා තොරතුරු ඒකකය | 2023.07.01 | 2023.12.31 |
| 5.<br>අදියර **05** - විශ්වවිද්‍යාල ශිෂ්‍ය අත්දැකීම් හුවමාරුව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ජාතික සමුළුව පැවැත්වීම | 0.200 | | 0.500 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මාධ්‍ය හා තොරතුරු ඒකකය | 2023.07.01 | 2023.08.31 |

15. <u>කාල රාමුව</u>

| කාර්යය | කාල නිර්ණය -2023 | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්තු 01 | | | කාර්තු 02 | | | කාර්තු 03 | | | කාර්තු 04 | | |
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන - 2023 | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

විශේෂ සටහන -

ආයතනික මුදල් ලැබීම , විශ්වවිද්‍යාල අධ්‍යන කටයුතු සහ අනෙකුත් අනපේක්ෂිත සාධක මත මෙම වැඩසටහන සැලසුම් කල කාල වකවානු වල සිදු කිරිමට බාධා පැමිණිය හැකිය. එසේම ප්‍රමාණවත් නොවන මූල්‍ය තත්වයන් හිදී විවිධ ආයතන/සංවිධාන/පුද්ගල ප්‍රදාන, මූල්‍ය පරිත්‍යාග සහ අනෙකුත් අනුග්‍රාහකත්වයන් ලබා ගැනීමට අපේක්ෂිතය. මෙම වැඩසටහන ලියාපදිංචි වන විශ්වවිද්‍යාල ශිෂයයන් මත යම් වෙනස්වීම් වලට ලක්විය හැකිය.

## 16. වැඩසටහන ඇගයීමේ ක්‍රමවේදය

මෙම වැඩ සටහනට අදාල අත්සන් ලේඛණ / පැමිණීමේ ලේඛණ, පෙර සහ පසු ඇගයුම් පත්‍රිකා මගින් ඇගයීම් සිදුකරයි.

**සංකල්ප පත්‍රිකාව සකස් කලේ**

නම : ශානිකා මලල්ගොඩ

තනතුර : අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු
(ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

අත්සන :

දිනය - 2023.01.17

**නිර්දේශය 01**

නම : අනෝමා සිරිවර්ධන

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
(ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

අත්සන :

දිනය - 2023. 01. 17

**නිර්දේශය 02**

නම : සුජාතා අලහප්පෙරුම

තනතුර : නියෝජ්‍ය සභාපති
(ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

අත්සන :

දිනය - 2023. /01/18

**අනුමැතිය**

නම : උදයකුමාර අමරසිංහ

තනතුර : සභාපති (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

අත්සන :

දිනය - 2023. 01. 19

ඇමුණුම 02

<u>විශ්වවිද්‍යාල සිසුන් සඳහා වන</u>

<u>"ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන"</u>

<u>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය</u>

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සංවිධානය කරනු ලබන **"ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන " විශ්වවිද්‍යාල සිසුන්ගේ** ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම අරමුණුකර ගත් **විශේෂයෙන් නිර්මාණය කරන ලද වැඩසටහනක් වේ.** ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඕනෑම විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර උපාධි අපේක්ෂක දෙවන සහ තුන්වන වසර සිසුන්ට පමණක් මෙම ස්වේච්ඡා වැඩසටහන සඳහා ලියාපදිංචි විය හැක. මෙම වැඩසටහන **විශ්වවිද්‍යාල ශිෂ්‍ය පරපුර අතර ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම වර්ධනය කරමින්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සමාජගත කිරීමේදී ළමා ආරක්ෂාව පිළිබඳ දැනුමින් පරිපූර්ණ උපාධිධාරියෙක්** නිර්මාණය කිරීම අරමුණු කර ගත් තිරසර වැඩසටහනක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ වෙමින් සිදුකිරීමට අපේක්ෂිතය.

යොවුන් වයසේදී විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපතිවරුන් ලෙස ළමා ආරක්ෂාවට අදාලව ආකල්ප, කුසලතා හා ලබා ගන්නා දැනුම, අනාගත වැඩිහිටියන් ලෙස හෝ වෘත්තිකයන් වශයෙන් විවිධ ක්ෂේත්‍ර වල නියැලීමේදී ළමා ආරක්ෂාවට ප්‍රමුඛතාවය ලබාදීම, ළමා අපයෝජනයට එරෙහිවීම, ළමයින් ආරක්ෂා කිරීමට හැකි සෑම අවස්ථාවකම පියවර ගැනීම, නිර්මාණශීලීව ළමා ආරක්ෂාව තහවුරු වන නිර්මාණ සහ සංකල්ප ගොඩනැගීම ආදියට දායක විය හැකි ළමා ආරක්ෂක නියමුවෙක් නිර්මාණය කිරීම මෙහිලා ප්‍රමුඛ කරගැනේ. මෙහිදී ශ්‍රී ලංකාව තුළ ළමා ආරක්ෂාවේ තත්වය අවබෝධ කර ගැනිමට හැකියාව මේ තුළින් ගොඩනැගෙනු ඇත. එසේම අනාගතයේදී විදේශ විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් සමග ළමා ආරක්ෂාවේ ගෝලීය අත්දැකීම් හුවමාරු කරගැනිමටද විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවකාශ ලැබෙනු ඇතැයි විශ්වාස කරනු ලැබේ.

විශේෂයෙන්ම, ළමා ආරක්ෂාවේදී යොවුන් උපාධි අපේක්ෂකයන් ළමා ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කරවීම වැදගත් වේ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් ලෙස එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා වගවීම මේ තුළින් බලාපොරොත්තු වේ. තරුණ පරපුර ලෙස රටේ අනාගත ළමා පරපුර රැකගැනිමේ යුතුකම ඉටු කිරීමට මෙම වැඩසටහන තුළින් අවස්ථා උදාවේ.

<u>මෙම වැඩසටහනේ අරමුණු</u>

1. ළමා ආරක්ෂාව පිළිබඳ වගකීමෙන් සහ වගවීමෙන් යුතු තරුණ ප්‍රජාවක් බිහිකිරීම.
2. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම.
3. ළමා හිතකාමී සහ ළමයින් සඳහා ආරක්ෂාකාරී පරිසරයක් ඇතිකිරීමට විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව සම්බන්ධ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම.
4. ළමා අපයෝජන සිදුවීම් අවම කරගැනීම සහ වලක්වා ගැනීමට විශ්වවිද්‍යාල සිසුන්ගේගේ යෝජනා ලබා ගැනීම සහ ඒ සඳහා ඔවුන්ගේ සහභාගීත්වය සහ දායකත්වය ලබා ගැනීම.

5. විශ්වවිද්‍යාල සිසුන් ළමා ආරක්ෂාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගිකරවා ගැනීම.
6. විශ්වවිද්‍යාල සිසුන්ගේ අදහස් හා ලබා ගනිමින් ළමා ආරක්ෂාවේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ ආණ්ඩුවට උපදෙස් ලබා දීමට දායකකර ගැනීම.
7. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් සමග සම්බන්ධීකරණය සඳහා අවස්ථා ලබා දීම.

<u>ලියාපදිංචිය</u>
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඕනෑම විශ්ව විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර උපාධි අපේක්ෂක දෙවන වසර සහ තුන්වන වසර සිසුන්ට පමණක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියේ පල කර ඇති අයදුම්පත බාගතකර නිසියාකාරව පුරවා ලියාපදිංචි තැපෑලෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමුකර මෙම ස්වේච්ඡා වැඩසටහන සඳහා ලියාපදිංචිය ලබා ගත හැකිය. සෑම ශිෂ්‍යයෙක් සඳහාම ලියාපදිංචි අංකයක් නිකුත් කරනු ලබන අතර, ලියාපදිංචිය ලබා ගත් බවට ලිපියක්ද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් නිකුත් කරනු ලැබේ.

<u>මෙම වැඩසටහන අදියර 05 කින් පැවැත්වේ.</u>

**අදියර 01 :** **"ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" සඳහා** ලියාපදිංචිය ලබාගත් විශ්වවිද්‍යාල වල උපාධි අපේක්ෂකයන් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන.

**අදියර 02 :** ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන යටතේ ලියාපදිංචි වූ උපාධි අපේක්ෂකයන්ට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමග වසර 01 සිට 03 දක්වා කාලයක් ස්වේච්ඡාවෙන් කටයුතු කිරීමට හැකියාව ලැබෙනු ඇත. එසේම පාසල් ශිෂ්‍ය තානාපති පාසලක් සමග කටයුතු කිරීමට අවස්ථාව ලබාදෙනු ඇත. ලියාපදිංචිය ලබා ගත් පාසල් ශිෂ්‍ය තානාපති සෑම පාසලක් සඳහාම, විශ්වවිද්‍යාල සිසුන් කණ්ඩායමක් මෙම වැඩසටහන යටතේ නම් කරනු ලැබේ. ඒ අනුව තනි සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කිරීමට විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත. මෙම වැඩකටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පූර්ණ අධීක්ෂණය,මගපෙන්වීම,තාක්ෂණික දැනුම,සම්බන්ධීකරණය සහ මෙහෙයවීම මත විශ්වවිද්‍යාල සිසුන් විසින් සිදුකළ යුතුය.

**අදියර 03** : ළමා ආරක්ෂාව පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන

<u>03.1 - පළමු දිනය</u>

1. ළමා අයිතීන්, ළමා ආරක්ෂාව, ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සහ ළමා ආරක්ෂක අධිකාරිය යනු කුමක්ද, කාර්යයභාරය සහ වැඩසටහන් පිළිබඳ හඳුන්වාදීම.
2. ළමා ආරක්ෂාවේදී විශ්වවිද්‍යාල සිසුන් විසින් අනුගමනය කළ යුතු ආචාරධර්ම හඳුන්වාදීම.
3. ළමයින්ගේ සහභාගීත්වය ලබා ගැනිම, ළමයින් සමග සන්නිවේදනය කිරිම සහ ළමයින් සමග මහජන සම්බන්ධතා පැවැත්විම.

<u>03.2 - දෙවන දිනය</u>

1. ළමයින්ට අදාල නීතිය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නීතිය බලාත්මතක කිරීම.
2. ළමයින්ට අදාල මනෝ සමාජයීය මැදිහත්කරණය.
3. අදහස් විමසීම සහ යෝජනා ලබා ගැනීම.

අදියර 04 : ළමා ආරක්ෂාව පිළිබඳ විශ්වවිද්‍යාල මට්ටමින්, ශිෂ්‍ය සම්පත්දායක සංචිත සැකසීම සහ ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික විශ්වවිද්‍යාල ශිෂ්‍ය සම්පත්දායක සංචිතය සැකසීම.

අදියර 05: විශ්වවිද්‍යාල ශිෂ්‍ය අත්දැකීම් හුවමාරුව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ජාතික සමුළුව පැවැත්වීම

උදය කුමාර අමරසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
දිනය : 2023.01.17

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| වර්ෂය | ලියාපදිංචි අංකය |
| 2023 | |

## විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වන " විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" සඳහා ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය -2023

| අංකය | | අදාල කොටුවට ( √) යොදන්න |
|---|---|---|
| 1 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි රජයේ විශ්වවිද්‍යාලයකි | |
| 2 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි පෞද්ගලික විශ්වවිද්‍යාලයකි | |

| ඔබගේ ඡායාරූපය (පාස්පෝට් ප්‍රමාණය) |
|---|

**01. විශ්වවිද්‍යාලය පිළිබඳ තොරතුරු**

(1.1) විශ්වවිද්‍යාලයේ නම

සිංහල/දෙමළ

...................................................................................................................................................

ඉංග්‍රීසි (අනිවාර්යයි)

...................................................................................................................................................

(1.2 ) විශ්වවිද්‍යාලයේ ලිපිනය

සිංහල/දෙමළ

...................................................................................................................................................

ඉංග්‍රීසි(අනිවාර්යයි)

...................................................................................................................................................

(1.3) විශ්වවිද්‍යාලය පිහිටා ඇති

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | |
| පළාත | |

**(02)** විශ්වවිද්‍යාල(අභ්‍යන්තර) උපාධි අපේක්ෂකයාගේ තොරතුරු

2.1 සම්පූර්ණ නම:-

....................................................................................................................................................

.........................................................................................................................

2.2 මුලකුරු සමග නම :-

..................................................................................................................................

2.3 ස්ත්‍රී පුරුෂ භාවය:- ස්ත්‍රී ☐ පුරුෂ ☐

2.4 උපන් දිනය:- ......................................................................

2.5 ජාතික හැඳුනුම්පත් අංකය :- ......................................................

2.6 විශ්වවිද්‍යාල හැඳුනුම්පත් අංකය:- ..................................................

2.7 පෞද්ගලික ස්ථිර ලිපිනය:-

....................................................................................................................................................

....................................................................................................................................................

.................................................................................................................

**(03)** ඔබගේ පදිංචිය පිළිබඳ පරිපාලන තොරතුරු

3.1 පළාත :- ...............................................................................................

3.2 දිස්ත්‍රික්කය :- ..........................................................................................

3.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ......................................................................................

3.4 ග්‍රාම නිළධාරී කොට්ඨාසය සහ වසම් අංකය :- ...................................................................

**(04)** ඔබගේ සම්බන්ධීකරණ විස්තර

4.1 ජංගම දුරකථන අංකය :- ............................................................
4.2 වට්ස්ඇප් අංකය :- ............................................................
4.3 ඊමේල් ලිපිනය :- ............................................................

**(05)** අධ්‍යාපනය ලැබූ පාසල් පිළිබඳ විස්තර

| අනු අංකය | පාසලේ නම | පාසල අයිති දිස්ත්‍රික්කය | අධ්‍යාපනය හදාරන ලද කාලය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

**(06)** **පාසල් කාලය තුළ ඔබ විසින් සිදු කරන ලද විශේෂ කාර්යයන් /විශේෂ දක්ෂතා/දරණ ලද තනතුරු ඇත්නම් සඳහන් කරන්න**

01.........................................................................................................................
02.........................................................................................................................
03.........................................................................................................................
04.........................................................................................................................
05.........................................................................................................................

**(07)** **ඔබ පාසලේ ශිෂ්‍ය නායකයකු ලෙස කටයුතු කර තිබේද ? (අදාල කොටුවට ( √) යොදන්න)**

ඔව් ☐ නැත ☐

**ඔව් නම් ශිෂ්‍ය නායකයකු ලෙස කටයුතු කරන ලද පාසල සහ දරණ ලද තනතුර** (උදා. ප්‍රධාන ශිෂ්‍ය නායක)

.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................

**(08)** **විශ්වවිද්‍යාලයේ ඔබගේ අධ්‍යයන කටයුතු පිළිබඳ තොරතුරු**

01. ඔබ විශ්වවිද්‍යාලයේ හදාරන පාඨමාලාවේ නම :- ..........................................................................

02. පීඨය :- ...........................................................................

03. අධ්‍යයන දෙපාර්තමේන්තුව:- ...........................................................................

04. පාඨමාලාව හදාරන මාධ්‍ය(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :- ..........................................................................

05. ඔබ හදාරණ උපාධිය (අදාල කොටුවට ( √) යොදන්න)

01. සාමාන්‍ය උපාධිය ☐

02. විශේෂවේදී උපාධිය ☐

**(09)** **විශ්වවිද්‍යාලය තුළ ඔබ විසින් සිදු කරන විශේෂ කාර්යයන් /විශේෂ දක්ෂතා/ දරණ ලද තනතුරු ඇත්නම් සඳහන් කරන්න**

01.........................................................................................................................
02.........................................................................................................................
03.........................................................................................................................
04.........................................................................................................................
05.........................................................................................................................

ඔබගේ භාෂා හැකියාව (අදාල කොටුවට ( √) යොදන්න) පිළිබඳ තොරතුරු

| භාෂාව | කියවීම | ලිවීම |
|---|---|---|
| සිංහල | | |
| දෙමළ | | |
| ඉංග්‍රීසි | | |
| වෙනත් (සඳහන් කරන්න) | | |

**(10)** ඔබ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

**(11)** ඔබ මීන් පෙර ළමා ආරක්ෂක අධිකාරියේ වැඩසටහන් වලට සම්බන්ධවී තිබේද? (අදාල කොටුවට ( √) යොදන්න)

ඔව් ☐ නැත ☐

**(12)** ඔව් නම් කෙටි හැඳින්වීමක් කරන්න

.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................
.....................................................................................................................................................

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ **"ළමා ආරක්ෂාව පිළිබඳ විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන "** සඳහා 2023 වර්ෂයට අදාලව ලියාපදිංචිය ලබා ගැනීමට කැමැත්තක් දක්වන අතර ස්වේච්ඡාවෙන් ළමා ආරක්ෂක අධිකාරිය සමග කැපවීමෙන් සහ වගකීමෙන් කටයුතු කරන බවත්, ළමා ආරක්ෂාව තහවුරු කිරීමට උපරිමයෙන් සහයෝගය ලබාදෙන බවටත්, උක්ත තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් තහවුරු කරමි.

| නම | අත්සන | දිනය |
|---|---|---|
| ......................................... | .............................. | .............................. |

<u>නිර්දේශ කිරීම</u>

(1) අධ්‍යනාංශ ප්‍රධානියා

නම : ..............................................
අත්සන : ..............................................
දූරකථන අංකය : ..............................................
දිනය : ..............................................
නිල මුද්‍රාව

(2) පීඨාධිපතිතුමා

නම : ..............................................
අත්සන : ..............................................
දූරකථන අංකය : ..............................................
දිනය : ..............................................
නිල මුද්‍රාව

(3) විශ්වවිද්‍යාල ලේඛකාධිකාරී

නම : ..............................................
අත්සන : ..............................................
දූරකථන අංකය : ..............................................
දිනය : ..............................................
නිල මුද්‍රාව

සැ.යු: ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේනම් අයදුම්පත සමග අදාල තොරතුරු ඇමුණුම් ලෙස ලබා දීමට කටයුතු කරන්න.

වැඩි විස්තර සඳහා අමතන්න


ශානිකා මලල්ගොඩ
අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
දු.අ: 071 - 7151506
011- 2778911 මාධ්‍ය ඒකකය දිගු අංකය (142)

ධනුෂ්ක සේනාරත්න
මාධ්‍ය හා තොරතුරු නිළධාරී
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
දු.අ : 071-5789775
011- 2778911/ දිගු අංකය (141)
011 - 5759965 මාධ්‍ය ඒකකය


---


ලිපිනය - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල
දුරකථන අංක - 011- 2778911-12-14 දිගු අංකය - 14 - මාධ්‍ය ඒකකය - 011-5759965
ළමා උපකාරක දුරකථන සේවාව : 1929
ෆැක්ස් අංකය - 0112778915
ඊමේල් - info.media@childprotection.gov.lk
වෙබ් අඩවිය - www.childprotection.gov.lk
යූටියුබ් චැනලය - National Child Protection Authority - Sri Lanka - https://youtube.com/user/slncpa
නිල ෆේස් බුක් පිටුව - https://www.facebook.com/NCPASriLanka/


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

ChildLine Sri Lanka
1929